# කිතුණු ඇදහිලලේ මුලධර්ම 1

## බයිබලයඃ දෙවියන්වහන්සේගේ වචනය

### හැඳින්වීම

**ශුද්ධ ලියවිලිඃ අප බයිබලය සලකන්නේ  චාචික පෙලඹවීමක් කරනු ලැබු දෙවියන්වහන්සේගේ වචනය, මුල් ලියවිලිවල වැරදි වලින් තොරව, සහ  දර්ශනයෙහි හා හා භාවිතාවෙහි උත්තරීතර අවසන් අධිකාරිත්වය සහිත ලියවිල්ල හැටියටය.”**

පැරඩි සඟරාවෙහි කාල් සාගන් ඔහුගේ තිබු පිලිකාවක් සමඟවු අත්දැකීම් පිළිබඳව ලිපියක් තිබුනා. මේ ජීවිතයෙන් පසු විශ්වාසයක් ඔහුට නොතිබුන බව ඔහු කීවා. කිතුණුවන්, මුස්ලිම්වරු, යුදෙව්වරු සහ හින්දුවරු ඔහු වෙනුවෙන් යාඥා කර තිබු බව ඔහු  කීවා. "දෙවිකෙනෙක් සිටින බව මා නොසිතන විට මා සඳහා වු උන්වහන්සේගේ සැලැස්ම උන්වහන්සේ වෙනස් කරනවා ඇත. මම කිව නොහැකි තරම්  කෘතඥ වනවා”. කාල් සාගන් තාරකා විද්‍යාව හදාරා තිබුනා ඔහු එවකට  සක්වල මත  අධිකාරිව සිටියා. නමුත්  ඔහුගේ අධ්‍යයනය ඔහුට මග පෙන්නුවේ මැවුම්කරුට නමස්කාර කරනවාට වඩා එවැන්නෙකු  ප්‍රතික්ෂේප කිරීමටය.

රෝම1ඃ 18-20 කියන්නේ එය නොවේද?

### කියවන්න රෝම1ඃ18-20

මක්නිසාද සත්‍ය අධර්මිෂ්ඨ කමින් වලක්වන්නාවූ මනුෂ්‍යයන්ගේ සියලු අභක්තියටද අධර්මිෂ්ඨකමටද විරුද්ධව දෙවියන්වහන්සේගේ උදහස ස්වර්ගයෙන් එළිදරව්වී තිබේ. මක්නිසාද දෙවියන්වහන්සේ ගැන දැනගන්ට පුළුවන්දේ ඔවුන් තුල ප්‍රකාශව තිබේ. කුමක් හෙයින්ද දෙවියන්වහන්සේ එය ඔවුන්ට ප්‍රකාශ කළ සේක. මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘෂ්‍යමාන දේවන උන්වහන්සේගේ සදාකාලිකවු බලය හා දෙවිකම මවන ලද දේවලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනීයන්නේය.

**කියවන්න** හෙබ්‍රෙව්1ඃ1-2

දෙවියන්වහන්සේ ආදි කාලයෙහි බොහෝ කොටස් වලින්ද බොහෝ අන්දම් වලින්ද ප්‍රොපේතවරුන් ලවා පියවරුන්ට කථා කරවා, මේ දවස්වල කෙළවරදී තමන්වහන්සේගේ පුත්‍රයාණන් ලවා අපට කථා කෙරෙවූ සේක. දෙවියන්වහන්සේ මොනවගේදැයි, උන්වහන්සේ සිතන්නේ, දැනෙන්නේ, ක්‍රියාකරන්නේ  කොහොමදකියා යේසුස්වහන්සේ එළිදරව් කරයි. දෙවියන්වහන්සේ  අප වෙනුවෙන් බයිබලය තුල වාර්ථාව ආරක්ෂාකර තබාඇත. දෙවියන්වහන්සේ, ක්‍රිස්තුස්වහන්සේ, මනුෂ්‍යත්වය, ගැළවීම, ස්වර්ගය යනු කුමක්ද යන්න ගැන අප විශ්වාස කරන මුලාශ්‍රය බයිබලයයි. අපේ අධිකාරිත්වය කුමක්දකියා ප්‍රශ්නයක් තිබෙනවාද? අප බයිබලය විශ්වාස කළයුත්තේ ඇයි? අපට දැනුම්දෙන, අපේ ජීවිත පාලනය කරන, බලය ඇති පොත එය වීමට අපට ඇත්තේ මොන සාක්ෂිද? ග්‍රීක් බසින්  ඇති  *biblos*, book; *biblia*, books. වචන බයිබලය තුල  පාවිච්චි වන්නේ නැත.

**බයිබලය දෙවියන්වහන්සේගේ අද්විතීය වචනයයි.**

දෙවියන්වහන්සේගේ වචනය අද්විතීය ලෙස බයිබලයෙහි ඇත.

ඒ පිළිබඳ සාක්ෂි දෙපෙළකින් ඇතඃ අභ්‍යන්තරව හා බාහිරව.

**බාහිර සාක්ෂි**

## 1. බයිබලයේ අඛන්ඩතාවය

වසර 1600ක් පමණ පුරා කතුවරයින් 40කට වඩා එය ලියා ඇත. එය තවමත් එක පොතකි, පොත් එකතුවක් නොවේ. කතුවරයින් වූයේ රජවරුන්, ගැමියන්, දාර්ශනිකයින්, ධීවරයින්, වෛද්‍යවරයෙක්, බදු අයකරන්නෙක්, රාජ්‍යතන්ත්‍රිකයින්, විද්වතුන්, කවියන් හා ගොවියන්ය.

එය ලියාඇත්තේ ඉතාලිය, ග්‍රීසිය, බැබිලෝනිය, පර්සියාව, සහ ඉශ්‍රායලය වැනි විවිධ රටවලින්ය. මනුෂ්‍ය කතුවරයින්, වෙනස් සංස්කෘතීන් තුල, වෙනස් අත්දැකීම් තුල, ජීවත්වූ අයයි. ඔවුන් චරිතයෙන් හා පෞරුෂත්වයෙන් වෙනස් අය වූහ. ඔවුන් භාෂා තුනකින් ලිවීය- **පරණ ගිවිසුමඃ** හෙබ්‍රෙව්, අරාමික,

අළුත් ගිවිසුමඃ ග්‍රීක් .

නමුත් බයිබලය වෙනස් කතුවරයින් විසින් ලියන ලද පොත් වල ගද්‍ය පද්‍ය සංග්‍රහයක් නොවේ. එහි උත්පත්ති පොතෙහි සිට එළිදරව් පොත දක්වා පුදුමාකාර අඛන්ඩතාවයක් හා ඒකත්වයක් ඇත.

*The Paradise Lost of Genesis becomes the Paradise Regained of Revelation. Whereas the gate to the tree of life is closed in Genesis, it is opened forevermore in Revelation.* (Geisler & Nix. *Evidence that Demands a Verdict*, p. 19)

දර්ශනය නොනැවතී බයිබලය මුළුල්ලෙහි දිගහැරී ඇත. ගැළවීම උත්පත්ති 3හි ඉඟි කර ඇත, පරණ ගිවිසුමෙහි පොරොන්දු හා ආදර්ශන මගින් සංවර්ධනය කර ඇත.ශුභාරංචි තුල ඉෂ්ඨ කර ඇත, යැවුම්පත්‍ර වල පැහැදිලි කර ඇත. එළිදරව්හි මහිමයේ සම්පූර්ණත්වයට ගෙනවිත් ඇත.

## 2. බයිබලීය එළිදරව්වේ ප්‍රමාණය

බයිබලයේ සියලුම පොත් ලියා ඇත්තේ කතුවරයන් නවීන සොයාගැනීම් ගැන නොදැන සිටි, මිනිස් දැනුමේ කලින් දිනවලදීය. නමුත් ඔවුන් ලියූ දේවල් පසු කලෙක සොයාගැනීම් සමඟ පටහැනි වූයේ නැත.

**යෙසායා40:22**
පෘතුවි චක්‍රය මතුයෙහි වැඩ ඉන්නේ උන්වහන්සේය,
එය ලියා ඇත්තේ වසර 2800කට පෙරදීය.

**යෝබ්26:7**
උන්වහන්සේ ශුවන්තලය මතුයෙහි උතුරු ප්‍රදේශය දිගහරින සේක, පොළොවද අවකාශයෙහි එල්ලා තබන සේක.
එය ලියා ඇත්තේ අවුරුදු 4000කට ඉහතදීය.
පුරාවිද්‍යාව නිරතුරුවම බයිබලීය ප්‍රකාශන තහවුරු කරන සාක්ෂි සපයයි(හිත්තිවරු, සාගොන්).

## 3. බයිබලය ප්‍රකාශයට පත්වීම හා බලපෑම

බොහෝ භාෂා ගණනකින් ප්‍රකාශයට පත්කර ඇති වෙනත් පොතක් නැත. එය තවමත් හොඳම විකිණීමයි. ප්‍රංශ අදේවවාදියෙකු වන වොල්ටෙයර් තමාගේ කාලයේ සිට අවුරුදු සියයක් ඇතුලතදී එය යල්පැන ගිය දෙයක් වනු ඇතැයිද කිතු දහම පැවැත්මෙන් අතුගැවී ගොස් ඉතිහාසයයෙන් බැහැරවනු ඇතැයිද කීවේය. නමුත් වොල්ටයිරේ ඉතිහාසයයෙන් බැහැරවිය, බයිබලය නොනැනවතී ලොවපුරා වැඩි වැඩියෙන් පැතිරෙන්නේය. ඇත්තෙන්ම වොල්ටයිරේගේ මරණයෙන් වසර 50කට පසු ජිනීවාහි බයිබල් සංගමය ඔහුගේ මුද්‍රණාලය හා නිවස බයිබල් ඇසිරීමට පාවිච්චි කළේය. (සාක්ෂි, පිටුව 23)

## 4. අත් පිටපත් සාක්ෂි

පවතින පුරාණ අත්පිටපත් කීපයක් සංසංදනය කරන විට, දෙවන ශතවර්ෂය තරම් කලින් දින සහිත, නව ගිවිසුමෙහි කොටස් ඇතුලත් අත් පිටපත් 13,000ක් ඇත.
බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ප්‍රධාන පුස්ථකාලාධිපති ශ්‍රීමත් ෆෙඩ්රික් කෙන්යොන් මෙසේ කියා ඇතෘ " එහි අංඩගු දේවලට කෙල්තියා සාක්ෂි සහිතව, අපක්ෂපාතී උගතෙකු විසින් ප්‍රතික්ෂේප නොකළ, හරවත් මෙවැනි පෞරාණික පොතක් අප වෙත ලැබී නැත"

## 5. බයිබලයේ අගතිගාමී නොවන අධිකාරිත්වය

මනුෂ්‍ය කර්තෘත්වය මනුෂ්‍යයාගේ අනුග්‍රාහිකත්වය නැතුව බිහි වී නැත. හොඳම මිනිසුන්ගේ (ආබ්‍රහම්, මෝසෙස්, දාවිත් පේත්‍රැස්) පාප, සහ දුර්වලකම්, බයිබලය වාර්ථා කරයි. සාතන් හා මිනිසුන්(යෝබ්)ගේ බොරු, හා වැරදි ආකල්ප එය වාර්ථා කරයි. එය අද මනුෂ්‍ය වර්ගයාගේ ජන්ම දැනුම අඩංගුව, අතිශයින් අවංකවු වාර්ථාවකි.

## 6. බයිබලයේ උතුම් චරිතය

බයිබලය දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා තුල ක්‍රියාත්මක කරන පුද්ගලයා හා දෙවියන්වහන්සේගේ මහිමය එළිදරව් කරන අධිස්වාභාවික පොතකි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වැනි පුද්ගලයෙකු මනුෂ්‍යයාගේ සොයාගැනීමක් කිරීමට කිසිවිටෙක හැකිවී නැත. ග්‍රීක් මිත්‍යා කථාවල ඔවුන්ගේ දෙවිවරු ඔවුන් විසින්ම පිළිරූ විශාල කරගෙන තිබීම මෙන් උන්වහන්සේ සොයාගැනීමට අපට පුළුවන් වුනත් එසේ කර නැත.

## අභ්‍යන්තර සාක්ෂි

**2තිමොති 3:16-17 කියවන්න**

නව ගිවිසුමෙහි දෙවියන්වහන්සේගේ හුස්මෙන් හෙවත් දේවානුභාවයෙන් යයි සඳහන් වන්නේ මෙම පදවල පමණය.

## ශුද්ධ ලියවිල්ල දේවානුභාවයෙන් ලියවුවකි

ශුද්ධ ලියවිල්ල දෙවියන්වහන්සේගේ හුස්මෙන් පිටවුවකි. ආශ්වාස කිරීම කතුවරයින්ට වැඩි වශයෙන් යොදන්නේ නැති නමුත් දෙවියන්වහන්සේගේ වචනය සඳහා යොදවා ඇත. කතුවරයින් වරදින සුළු හා වැරදි සහිත වන අතර, දෙවියන්වහන්සේ ඔවුන්ගේ මනස තුලට හුස්ම හෙළීමෙන් උන්වහන්සේගේ නොවරදිනසුළු වචන ලැබීමෙන් ඔවුන් ලියුදේ නිරවද්‍ය දේව වචනය වුයේය.
මනුෂ්‍ය කතුවරයින්ට කුමක් ලියන්නේද කියා දෙවියන්වහන්සේ කීවේ කෙසේද?
යාන්ත්‍රික "කියවන විට ලිවීමක්" නොවේ.

**2පේත්‍රැස්1:20-21 කියවන්න**

බෝට්ටුවක් එහි මගීන් ගමනාන්තයට ගෙනයෑමක් මෙන් වීමට වඩා මනුෂ්‍ය කතුවරයින් දෙවියන්වහන්සේ අදහස් කළ තැනට උසුලාගෙන හෝ ඇදගෙන යාමක් සිදුවනු ලැබුවේය.

**දෙවියන් වහන්සේ උන්වහන්සේගේ වචනය සන්නිවේදනය කිරීමට විවිධ මාර්ග පාවිච්චි කළ සේක.**

**නික්මයාම 34:27** මෙම වචන ලියාගන්න.
ස්වාමීන්වහන්සේගේ වචනය අනාගතවක්තෘන්ට පැමිණියේය.: යෙරමියා1:2 හොෂෙයා 1:1
දර්ශන සහ සිහින, දානියෙල් 2:1,7:1
එමනිසා ශුද්ධ ලියවිලි යනු දෙවියන්වහන්සේගේම ප්‍රකාශනයයි. එය සම්පූර්ණයෙන්ම අධිකාරිත්ව හා උන්වහන්සේ මෙන් සම්පූර්ණ විය යුතුය. නැතහොත් උන්වහන්සේ ඇත්තේ වැරදීමක් තුල සහ වැරදි වන සුළුය.

**ආනුභාවයේ ප්‍රමාණය- සියලු ලියවිල්ල**

සියලුම වචන දෙවියන්වහන්සේ සමානව ආනුභාවත් කර ඇත. වාචික යනු වචනය නිෂ්ශේෂ යනු පූර්ණය. එය දෙවියන්වහනසේගේ වචනය පමණක් නොව, එය ඔබට කථා කරන විට වචන පමණක්ම නොව,
**1තිමොති5:18**- පාවුල් තබයි **ලූක් 10:7 ද්විතීය කතාව 25:4** මෙන් අධිකාරිත්ව මට්ටමක් ඇත. ලියවිලි දෙකම ඔවුන් කැඳවයි.
**2පේත්‍රැස් 3:15-16**- පේත්‍රැස් ලියවිලේ ඉතිරි කොටසට සමානව පාවුල්ගේ ලියවිල්ලට යොමු කරයි.

## වාචික  පූර්ණ ආනුභාවය

### අර්ථදැක්වීම

ආගමීඃ  ලියවිලි වල කෘ    ෑන් ශුද්ධඃත්මයාණ   වහෘ සේගේ අධිස්වාභාවික මෙහව   තුලින්  ඔවුන්ගේ පෞරුෂත්වය මගින් , වැරදි සිදුනොවී, ඔවුන්ගේ මුල් අත්අකුරින්ම ලියා, මනුෂ්‍යයාට දුන් දෙවියන්වහන්සේගේ එළිදරව්ව රචනා කිරීමට හා වාර්ථා කිරීමට මෙහෙයවීය.
දෙවියන්වහන්සේගේ ආත්මය, මනුෂ්‍ය කතුවරුන් විසින් මුල් ලියවිලිවල තිබූ වචන තෝරාගැනීමෙහිදී මග පෙන්වීය. රචකයන්ගේ පෞද්ගලික ගති ලක්ෂණ, රචනා ශෛලිය සහ වාග් මාලාව, ඔවුන්ගේ  සිතිවිලි, මතයන්, අවුල්සහගත දේවල්, යාඥා හෝ භය ඇතිවීම ආදිය බොහෝ වි ප්‍රකාශයට පත්වීම විවිධ පොත් වලින් පරාවර්ථනය වේ.
ලුක් වෛද්‍යවරයෙක්  වූ අතර ඔහු වෛද්‍යමය  යෙදුම් භාවිතා කළේය.
පාවුල් ග්‍රීක් සාහාත්‍යයේ විද්වතෙක් හැටියට ග්‍රීක් කාව්‍යමය යෙදුම් උපුටා දැක්වීය. (ක්‍රියා17)
දෙවියන්වහන්සේ මනුෂ්‍ය රචකයින් යොදාගත් අතර  මෙම මිනිසුන්  ඔවුන් ලියන්නේ මොනවාදැයි නිතර දැන සිටියේ නැත. (දානියෙල්12:8-9)
කෙසේ නමුත් දෙවියන්වහන්සේගේ  මගපෙන්වීමේ හස්ථය යටතේ  ඔවුන්   අපූර්ව ඒකත්වයක් සහ  ලියන ලද දේ පිළිබඳව ශුද්ධාත්මයාණන්වහන්සේගේ මග පෙන්වීමේ ක්‍රියාවට නිරතුරුවමව සාක්ෂි වෙමින් පොත් 66ක් නිෂ්පාදනය කළෝය.

## අනුරූපී අභ්‍යන්තර සාක්ෂිය

බයිබලය පරණ ගිවිසුම හා අළුත් ගිවිසුමෙහි දිගටම දේව වචනය  අනුරූපීව පවතින බව  දක්නට තිබේ.
නික්මයාම20:1, ද්වීතීය කතාව 6:6-9,17, 2සාමුවෙල්22:31,23:2, ගීතාවලිය19:7-11, 119:11, 18,89-91,97-100,104,5,130, හිතෝපදේශ30:5-6, යෙසායා55:10-11, 22:19, මාර්ක්13:31, යොහාන්2:22, 5:24, 10:35, ක්‍රියා17:11, 2තිමොති2:15, 1පේත්‍රුස්1:23-25, එළිදරව්1:1-3, 22:18.

## යේසුස්වහන්සේගේ සාක්ෂිය

## යේසුස්වහන්සේ සහ පරණ ගිවිසුම

මතෙව්5:18,  යොහාන්10:35.  ශුද්ධ ලියවිල්ල කැඩීමට නුපුළුවන.
උන්වහන්සේ පැමිණියේ පරණ ගිවිසුම සම්පූර්ණ කිරීමටය.
මතෙව්1:22-33,4:14, , 8:17, 12:17,15:7-8, 21:4-5.
ගීතාවලිය110:1 සහ මතෙව් 22:43-44.  වචනයකට පවා නිරවද්‍යය. ශුද්ධ ආත්මයාණන් සහ දාවිත්
ලූක්24:27-  උන්වහන්සේම ගැනවූ සියලු ශුද්ධ ලියවිලි පද නිරවද්‍යය. යොහාන්5: 39-40
උන්වහන්සේ නව ගිවිසුමෙහි සෑම වැදගත් කෙටසක් තුලම උන්වහන්සේ පරණ ගිවිසුමෙන් උපුටා දක්වා ඇත, (බොහෝවිට නිදහස් මතධාරීන් විසින් ආරවුල් ඇති කළ  පොත්වල)උදාහරණඃ  ද්විතීය කතාව, යෝනා, දානියෙල්. ද්විතීය කතාව6:16,"මතෙව්4:7, යෝනා, මතෙව්12:40, දානියෙල්9:27, 12:11- මතෙව්24:15.   යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ චරිතය හා සත්‍යතාවය ප්‍රශ්න කරන්නේ නැතිව පරණ ගිවිසුමේ වචන වල ආනුභාවය ප්‍රශ්න කිරීමට පුළුවන්කමක් නැත.  ක්‍රිස්තුස්වහන්සේගේ විශ්වාසනීටත්වය ප්‍රතිඵලයයි. " සත්‍යය මමයි" යයි උන්වහන්සේ කීසේක.  නිදහස් මතධාරීන්ගේ විවේචන මෙන් උන්වහන්සේම උන්වහන්සේගේ වයස ගැන වැරදි ආකල්ප වලට ඉඩ සලසා දුන්නේ නැත.

## යේසුස්වහන්සේ සහ නව ගිවිසුම

යේසුස්වහන්සේ  නවගිවිසුමේ ලියවිලි ගැන කලින් කියා තිබුනේය. යොහාන්14:25-26,15:26-27,16:12-13.
ශුද්ධාත්මයාණන්වහන්සේ පරණ ගිවිසුමේ ලේඛකයින්ට කළ දේම  අළුත් ගිවිසුමේ මනුෂ්‍ය ලේඛකයින්ටද කරන්නට ඇත.
බයිබලය සම්බන්ධව යේසුස්වහන්සේගේ සාක්ෂිය ඇත්තෙන්ම නිෂ්චිත කළ යුතුව ඇත. අප උන්වහන්සේ පාපයෙන් තොර දෙවියන්වහන්සේ බව අප විශ්වාස කරනවා නම්,  සත්‍යහය යනු උන්වහන්සේය කියා අප විශ්වාස කරනවානම්, ශුද්ධ ලියවිල්ල පිළිබඳ උන්වහන්සේගේ තක්සේරුව නිරවද්‍ය බව අපට පිළිගැනීමට සිදුවනවා. අපට හැම දෙයක්ම සම්පූර්ණ ලෙස  තේරුම්ගැනීමට නොහැකි වෙන්නට පුළුවන්. එය අත්‍යවශ්‍යම නොවේ. න්‍යෂ්ටික ශක්තිය ගැන කිසිවක් මට තේරෙන්නේ නැහැ, නමුත් මම එය විශ්වාස කරනවා එහි බලය ගැන සාක්ෂි මම දැක තිබෙනවා. ශුද්ධ ලියවිලි තුල ඇති සෑම දෙයක්ම මට හොඳින් තේරෙන්නේ නැතත් මම ශුද්ධලියවිලි තුල ඇති බලයද අත්දැක තිබෙනවා.

බයිබලයට යෝග්‍ය ලෙස කරන පිවිසුමක ශුද්ධ ලියවිලි එළිදරව් කරන සියලු දේවල් අපට තේරුම්ගැනීමට නොහැකි බව හඳුනාගැනීමද ඇතුලත්වන නමුත් අපට තේරුම්ගැනීමට පුළුවන් දේවල් අලංකාර ලෙස එකමුතු වී, එය දෙවියන්වහන්සේ හා උන්වහන්සේ තුල අදහාගැනීම පිළිබඳව එකම, නිරවද්‍ය දැනුමේ උල්පත බව අපට තේරුම්ගැනීමට පුළුවන. දානියෙල් පොතෙහි අනාගතවාක්‍යය ඉෂ්ඨසිද්ධවූ සාක්ෂිය මෙන්, යේසුස්වහන්සේගේ සාක්ෂිය, සහ ශුද්ධාත්මයාණන්වහන්සේ ඉතා බලවත් ලෙස එය පාවිච්චි කරන කාරණය ශුද්ධ ලියවිල්ල, සියල්ල දන්නා, සියලු බල ඇති, අපට ප්‍රේමකරන, උන්වහන්සේගේ පුත්‍ර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුලින් අප උන්වහන්සේගේම කරගත්, දෙවියන්වහන්සේ හෙලු හුස්ම බව තහවුරු කරගැනීමට බලකරයි. එමනිසා අපට අපේ ඇදහිල හා චර්යාව සඳහා අධිකාරිත්වය බයිබලය බව අපට විශ්වාස කිරීමට පුළුවන.

## බයිබලීය අධිකාරිත්වය

**අර්ථදැක්වීම: නිෂචිතකමක් හා නිසැකකමක් ඇතිව දෙවියන්වහන්සේගේ චරිත ලක්ෂණ හා කැමැත්ත සමඟ සන්නිවේදනය කිරීමට දිව්‍යමය ලෙස ව්‍යුත්පන්න වු බලයක් සහිත දෙවියන්වහන්සේගේ වචනයේ ලිඛිත ආකාරය.**

**ශුද්ධ ලියවිල්ල අධිකාරී බලයෙන් යුක්ත වීමට හේතු:**

1. ඒවා දෙවියන්වහන්සේගේ හුස්මෙන් යුක්තවීම
2. ඒවා ලියන ලද්දේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලැබු තෝරාගත් මනුෂ්‍යයින් විසින් වීම
3. ඒවා ස්වාමීවු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දේව සිරසෙහි දෙවන පුද්ගලයා- විසින් සහතිකවී තිබීම
4. ඒවා ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් යොදවාගනු ලැබු වචනය. එපීස6:17,හෙබ්‍රෙව්4:12, 1තිමොති 4:1 ආත්මයාණන්වහන්සේගේ කඩුව ආදිය.
5. ඔවුන්ගේ ඒවායේ අභිමානය වුයේ සම්පුර්ණයෙන්ම දෝෂහරණය කරනු ලැබීමයි.

**නැවත කියවන්න. 2තිමොති3:16-17**

**දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියා වලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ.**

**ආගම ධර්මට අයත් බව එනම් පොත් මැන තිබු ප්‍රමිතියයි.**

## ධර්මයෙහි අන්තර්ගතය සඳහා පරීක්ෂා

1. **එය අධිකාරීත්වයෙන් යුක්තද?** (ස්වාමීන්වහන්සේ කියන සේක)
2. **එය අනාගතවාඛ්‍යමයද?**( එය ලියන ලද්දේ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක්ද?)
3. **එය අව්‍යාජද?** (එය සැක සහිත නම් ඉවත දමන්න)
4. **එය ගතිකද?** (එයට දෙවියන්වහන්සේගේ ජීවිත පරිණාමණය කිරීමේ බලයක් තිබුනාද?)
5. **එය ලැබී, එකතුකර, කියවා භාවිතා කළාද?** - දෙවියන්වහන්සේගේ මිනිසුන් විසින්)

## නව ගිවිසුම සඳහා පරීක්ෂා

### ප්‍රේරිත අධිකාරිත්වය හෝ ආගම ධර්මයට අයත්දැයි ප්‍රථමික පරීක්ෂා අනුමැතිය

**භාවිතය**

මෙය සත්‍යය නම් දේව වචනයට අපේ ප්‍රතිචාරය විය යුත්තේ කුමක්ද? ඇදහිල්ල! එය මුළානොවන විශ්වාසදායී හා අධිකාරීමය බැවින් අප එය විශ්වාස කළ යුතුයි. එයට අවනත වීමට අප ආශා විය යුතුයි. දෙවියන්වහන්සේ සතුටු කළ හැකි එකම විධිය එයයි. එය කියවීම, අධ්‍යයනය කිරීම, හා එය මත භාවනා කිරීම හා කටපාඩම් කිරීම අත්‍යවශ්‍යක වන්නේ එනිසාය. අපේ මනස දේව වචනයෙන් සංතෘප්ත විය යුතුයි. එවිට එය ඇසෙන විට වැරැද්ද අප හඳුනාගන්නවා ඇත. ශුද්ධ ලියවිලි අපේ මනස ආරක්ෂා කරන රැක බලාගන්නාය. මෙය අපේ කොටසක් ලෙස උත්සාහය තිබිය යුතුය. එය එක්වරම සිදුවන්නේ නැත! ඔබ දෙවියන්වහන්සේගේ වචනය සමඟ ස්ථිරව සිටීමේ කාලයෙන් ඉවතට ගැනීමට ඔබට සතුරෙක් ඇත. නමුත් ඔබටත් වචනයෙන් ප්‍රබෝධමත් කරන ඔබට එය තේරුම් ගැනීමට සලස්වන ශුද්ධාත්මයාණන්වහන්සේ ඇත. උන්වහන්සේ ඔබේ සතුරාට වඩා ඉතා බලවත්ය. ඔබට උපකාර කිරීමට උන්වහන්සේ මත රඳාපවතින්න.

ලෝකය කුමක් කීවත් දෙවියන්වහන්සේගේ වචනය අපේ සිතිවිලි හා හැසිරීම්වල ප්‍රමිතිය, පාලනය කළ යුතුය. ජීවිතයේ සෑම අවස්ථාවකදීම ප්‍රතිචාර දක්වන්නේ දෙවියන්වහන්සේගේ වචනයට අනුව හෝ අපේම හැඟීම් වලට සහ වෙනත් අයගේ අවවාද වලට අනුවද කියා තොරාගැනීමට ඇත. ඔබගේ ජීවිතයේ ශුද්ධ ලියවිලි වලට අනුව නිවැරදි කරගත් අංශ තිබෙනවාද?

ඔබගේ ජීවිතයේ දිශාව ඔබ නැවත සකස් කරගෙන තිබෙනවාද?
ශුද්ධ ලියවිල්ල ස්වාමීන්වහන්සේට සේවය කිරීම සඳහා යොදාගැනීමට සහ ධෛර්මත් වීමට ඔබට උපකාරීවේද?
සංස්කෘතිය ශුද්ධ ලියවිල්ල සමඟ පටහැනි වන විට, -උදා: ගබ්සාව, "දුක් නොවිඳ මැරීම" සමලිංගික ක්‍රියා, - ඔබ විශ්වාස කිරීමට තෝරාගන්නේ කුමක්ද?
ඔබේ විවාහයට පෙර හෝ විවහයෙන් පිටතදී ඔබේ කාමආශාවන් සංසිඳුවාගැනීමට පරීක්ෂා කරනු ලබනවිට, ඔබ කුමන තීරණයක් ගනියිද?
පවුවල හා මිතුරන් සමඟ සම්බන්ධතාවයන් හසුරුවා ගැනීමේදී දෙවියන්වහන්සේගේ වචනය කෙසේ උපකාරීවේද?
ඔබ කරන රැකියාවේ ආකාරයට දෙවියන්වහන්සේගේ වචනය කෙසේ බලපායිද?
වෙනත් කෙනෙකුගේ පාපවලට සමාව දීමට දෙවියන්වහන්සේගේ වචනය ඔබට කෙසේ උපකාරීවේද?
ක්‍රිස්තුස්වහන්සේ තුල පරිනත වීමට ඔබට එය කෙසේ උබකාරීවේද?
අප මිනිසුන් අතර වඩාත්ම ආශිර්වාද ලත් අයයි. අවුරුදු 3400ක විශ්වාසනීයත්වයක් ඔප්පු කරනු ලැබූ ජීවිත මගපෙන්වීමක් අපට තිබෙනවා. ලෝකයේ තවත් එවැනි පොතක් නැත. දෙවියන්වහන්සේගේ වචනයම සදාකල් විශ්වාසදායකය. දෙවියන්වහන්සේ සත්‍යය හා විශ්වාසදායක නිසා එය කිසිවිටෙක අප වැටෙන්ට අරින්නේ නැත. නමුත් අපේ අත්දැකීම් තුල එය විශ්වාස කිරීම හා අවනතවීම මගින් එය සත්‍යබව සොයාගැනීමටපමණක් යුතුව ඇත. එය ජීවිතයේ ප්‍රීතිය හා සෞභාග්‍යයේ යතුරයි.

## අධ්‍යයන ප්‍රශ්න

**කියවන්න රෝම1:18-21**

1. මුළු මනුෂ්‍ය වර්ගයාට තමන්වහන්සේම ගැන දෙවියන්වහන්සේ එළිදරව් කරන්නේ මොනවාද? කුමක් තුලින්ද? ඔවුන්ගේ ප්‍රතිචාරය කුමක්ද? දෙවියන්වහන්සේගේ තීන්දුව කුමක්ද?

**කියවන්න** 1යොහාන්5:9-12, යොහාන්1:18, හෙබ්‍රෙව්1:1-4

2. තවදුරටත් උන්වහන්සේම ගැන එළිදරව් කරන්නේ කුමන මාර්ග දෙකෙන්ද?

**කියවන්න** 2තිමොති3:16-17

3.ශුද්ධ ලියවිල්ල කෙතරම් හොඳින් දිව්‍ය හුස්මගත කර ඇද්ද? එය ප්‍රයෝජනවත් වන්නේ කුමටද? එය ඔබ සඳහා කර ඇතැයි ඔබ සිතන විශේෂිත අවස්ථා ගැන ඔබට සිතිය හැකිද?

**කියවන්න** 2පේත්‍රුස් 1:20-21

4. බයිබලයේ මනුෂ්‍ය කතුවරයින් ලිවිය යුත්තේ කුමක්දැයි දැනගත්තේ කෙසේ? දෙවියන්වහන්සේ පාවිච්චි කළ ක්‍රම මොනවාද? ( නික්මයාම34:27, යෙරමියා1:2, හොෂෙයා1:1, දානියෙල් 2:1, 7:1, 8:17)?
මතෙව්5:17-19, යොහාන්10:35, ලූක් 24:27

5. පරණගිවිසුමේ ශුද්ධ ලියවිලි ගැන යේසුස්වහන්සේගේ දැක්ම කුමක්ද? උන්වහන්සේගේ චරිතයේ ආලෝය තුල උන්වහන්සේ එය සැලකුවේ කෙසේද කියා දැනගැනීමේ වැදගත්කම කුමක්ද?

**කියවන්න** මතෙව් 1:22-23, 4:14, 8:17,12:17, 15:7-8, 21:54-5

6. පරණ ගිවිසුම ගැන අනාගතවාඛ්‍යය සම්පුර්ණ වුයේ එහි නිරවද්‍යතාවය තුල කෙනෙකුගේ ඇදහිල්ල ශක්තිමත්වන්නේ කෙසේද?

**කියවන්න** යොහාන්14:25-26,15:26-27,16:12-13

7. අළුත් ගිවිසුම ලියවෙනු ඇතැයි යේසුස්වහන්සේ කල්තියා කීවේ කෙසේද? කතුවරයා වෙන්නට ඇත්තේ කවුද?

**කියවන්න** එපීස6:17, හෙබ්‍රෙව්4:12

8. වසර සිය ගණනකට පෙර ලියවුන අනෙක් පොත් වලින්(උදා: ශේක්ස්පියර්)
ශුද්ධ ලියවිල්ල වෙනස් වන්නේ කෙසේද? ඒ ගැන එයම කියන්නේ මොනවාද?

9. මේ සියල්ල සත්‍යය නම්, බයිබලයේ අධිකාරිත්වය දෙසට අපේ ආකල්පය විය යුත්තේ කුමක්ද? එය නිරවද්‍ය බවට අපට විශ්වාසය තැබිය හැකිද? එය කොපමණ සත්‍යය හා අධිකාරීත්ව දැයි අපට කොතරම් ගණන් ගත හැකිද? එය සමඟ ඔබ කරමින් සිටිය යුත්තේ කුමක්ද?

බලන්න: යෝෂුවා1:8, 2තිමොති2:1, ගීතාවලිය 119:11,105, යාකොබ්1:22

සම්බන්ධිත මාතෘකා: බයිබල් ශාස්ත්‍රය ( ලිඛිත වචනය, විෂයමාලාව:( Related Topics: Bibliology (The Written Word), Curriculum )